ප්‍රිය පාඨක සහෝදර, සහෝදරියනි,

- ලෝකාලෝක සඟරාවේ 2015 මාර්තු - මැයි කලාපය ප්‍රකාශයට පත් නොවූ බව ඉතා කණගාටුවෙන් ඔබට දන්වා සිටිමි.
- ඔබගේ ලිපිනයෙහි ඇති දෝෂ හෝ තැපැල් මාර්ගයේදී ඇතිවන අවහිරතා නිසා ඔබට සඟරාව නොලැබී යාමට ඉඩ ඇත.
- ඔබගේ ලිපිනය වෙනස් වී ඇති නම් කරුණාකර එය අපට දන්වා එවන්න.

මෙම කලාපය - ජූනි - අගෝස්තු

ඊළඟ කලාප - සැප් - නොවැම්බර්

දෙසැම්බර් - පෙබරවාරි

මාර්තු - මැයි

මෙම සඟරා සේවයට ඔබත් දායක වීමට කැමති නම් ඔබගේ මුදල් ඇණවුම් චෙක්පත් පහත ආකාරයට එවන්න.

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
තැපැල් කාර්යාලය
වැල්ලවත්ත.

සංස්කාරක :
ලෝකාලෝකය
ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන : 0112 581 901
www.christianfellowshipcentre.com

මුද්‍රණය : ප්‍රසාද් ග්‍රැෆික් ඇන්ඩ් ප්‍රින්ටින් - නො. 306, මිරිස්වත්ත, පිළියන්දල.
දුරකථන : 0115 242515/ 071 2228903
විද්‍යුත් තැපැල් : prasad.graphic@yahoo.com

# ලෝකාලෝකය

2015 ජූනි - අගෝස්තු කලාපය

දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව
සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස,
දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල
ඉගැන්වීමටත්, තරවටුවටත්, හික්මවීමටත්, ධර්මිෂ්ඨකම ගැන ගුරුකම්
දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ.
(2 තිමෝති 3:16)

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය,
විවේකානන්ද පාර,
කොළඹ 06.

# ඔබගේ නිවසට ශක්තිමත් අත්තිවාරමක් තිබේ ද?

මතෙව් 7 24 - 29 දක්වා හොඳින් කිහිප විටක් කියවන්න. එම උපමා කතාව තේරුම් ගැනීමට උත්සාහ කරන්න. මෙම උපමා කථාවෙන් යේසුස්වහන්සේ පෙන්වා දෙන්නේ ඥාණවන්ත මනුෂ්‍යයකු හා ආඥාණ පුද්ගලයකු පිළිබඳවයි. එනම් සැබෑ කිතුණුවකු හා නාමික කිතුණුවකු ගැනයි. දෙදෙනාම කල්පනා කරන්නේ ඔවුන් සැබෑ කිතුණුවන් ලෙසය. ඔවුන් දෙදෙනාම තම ගෙවල් ගොඩ නගයි. දෙදෙනාම සමාන, ගෙවල් දෙකක් ගොඩ නගයි. පෙනුමෙන් සමානයි. නමුත් එක වෙනසක් තිබුණි. එක නිවසකට අත්ති වාරමක් තිබුණි. අනිකට අත්තිවාරමක් තිබුණේ නැත. ලූක් 6:48 - 49 අනුව එකෙක් පර්වතයට පිට ගැඹුරට හාරා අත්තිවාරමක් දැමීය. නමුත් අනිකා වැලිමත ගොඩ නැගීය.

මෙහිදී අපට ඉගෙනීමට හැකි වැදගත්ම පාඩම නම් සැබෑ කිතුණුවා හා ව්‍යාජ කිතුණුවා පහසුවෙන් වෙන් කර හඳුනා ගැනීමට නොහැකි බවය. ඔවුන් දෙස බැලූ විට පෙනෙන්නේ සැබෑ කිතුණුවන් ලෙසය. සභාවට යයි, බයිබලය කියවයි. සේවය කරයි. පරිත්‍යාගශීලිය, නමුත් ඔවුන්ට අත්තිවාරමක් නොහොත් ක්‍රිස්තුස්වහන්සේ සමඟ පුද්ගලික සැබෑ සම්බන්ධතාවයක් නැත. තමන් රවටා ගනිමින් සිටියි.

නිවසක වඩාත්ම වැදගත් වන්නේ අත්තිවාරමය. පිටතින් බාහිර අලංකාරයෙන් කොපමණ පියකරු වුණත් එය ශක්තිමත් අත්තිවාරමක් පිට



ගොඩ නගා නැත්නම් එය නිෂ්ඵලය. මනුෂ්‍යයාට තම ජීවිතයට අත්තිවාරමක් අවශ්‍යය. ඒ මත තම ජීවිතය ගොඩනගා ගත යුතු බැවිනි. මනුෂ්‍යයන්ට තිබිය හැකි වඩාත් ආරක්ෂාකාරී සහතික අත්ති වාරම නම් යේසුස්ක්‍රිස්තුස්වහන්සේය. (1 කොරින්ති 3 : 11) යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පර්වතය ය. අන් සියල්ල හා සියලු දෙනා වැලිය.

වැලි මතුපිට ඔහුගේ නිවස ගොඩනැගූ බොරු කිතුණුවා "මම හොඳින් ආරක්ෂා වී සිටිමි. මම කිතුණුවෙක් වෙමි. මගේ නිවස කඩා වැටෙන්නේ නැත." ආකාරයට කල්පනා කරයි. යක්ෂයා මිනිසුන්ට නැති බොරු සුරක්ෂිතභාවයක හැඟීමක් ඇති කිරීමට හැමවිටම උත්සාහ කරයි.

නමුත් අපි හැමෝම තම තමාව පරීක්ෂා කර බැලිය යුතුය. අප ගොඩ නගන්නේ මොන ආකාරයේ නිවසක් ද? මොන අත්තිවාරම පිටද යන්න. අපගේ ආශාව ලෞකික කාරණාවල සාර්ථකත්වය ලබා ගැනීම නම්, ධනය, බලය, කීර්තිනාමය, ගෞරවය, ආරක්ෂාව, සැපසම්පත් පමණක් සොයන්නේ නම්

ඔබ වැලි මත නිවස ගොඩනැගූ තැනැත්තාට සමානය. එසේ නැති නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරමින් උන්වහන්සේගේ ආඥා රක්ෂා කරමින්, උන්වහන්සේට සේවය කරමින් උන්වහන්සේගේ සමානත්වයට පත් වීමට උත්සාහ කිරීම නම් ඔබ ඔබගේ නිවස ගොඩනගන්නේ පර්වතය පිට අත්තිවාරම් දමාය.

නාමික කිතුණුවා හැමවිටම සොයන්නේ, තමාගේ යහපතමය. තමාගේ සතුට වෙනුවෙන් ඔහු ජීවත් වෙයි. ඔහු දෙවියන්වහන්සේගේ රාජ්‍යයත්, ධර්මිෂ්ඨකමත් සොයන්නේ නැත. ඔහු දෙවියන් වහන්සේගේ ආශිර්වාද සොයන නමුත් දෙවියන් වහන්සේ සොයන්නේ නැත. ඔහු තමන්ට ආදරය කරන අයට ආදරය කලත් අන් අයට ප්‍රේම කරන්නේ නැත. ඔහු දෙවියන්වහන්සේ දෙන ආශිර්වාද වලට ප්‍රේම කරන නමුත් දෙවියන් වහන්සේට ප්‍රේම නොකරයි. ඔහු ක්‍රිස්තුස් වහන්සේ අදහන බව පෙන්නුම් කලත් ඔහුගේ ජීවිතයේ ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමිත්වයට යටත් නොකරයි. ඔහුගේ ජීවිතය අත්තිවාරම ලෙස ක්‍රිස්තුස් වහන්සේව පිළිනොගනියි. ඔහුගේ නිවස ගොඩනගන්නේ වැලි මතය.

සැබෑ කිතුනුවා සත්‍ය ලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හඳුනාගෙන උන්වහන්සේට කීකරුව, උන්වහන්සේගේ වචනවලට සවන් දී, දෙවියන්වහන්සේගේ කැමැත්ත තම ජීවිතයේ ක්‍රියාත්මක කරයි. ක්‍රිස්තුස්වහන්සේ හඳුනාගැනීම යනු උන්වහන්සේට අවංකව ප්‍රේම කිරීමයි. උන්වහන්සේට ප්‍රේම කිරීම යනු උන්වහන්සේගේ ආඥාවලට කීකරු වීමය (යොහන් 14:21). පර්වත මත තම නිවස ගොඩනගන්නේ ඔහුය. (ලූක් 11:28 හා යොහන් 13:17)

නාමික කිතුණුවන්ගේ සංඛ්‍යාව දිනෙන් දින ඉහල යන සභා පරිසරය තුළ ඔබත් මේ කොයි කණ්ඩායමට අයත් වන්නේ ද කියා දෙවියන්වහන්සේගේ ඉදිරිපිටදී ඔබම සෝදිසි කර බලන්න.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමඟ පුද්ගලික හා ගැඹුරු සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට හැම විටම උපකාරී වන්නේ උන්වහන්සේගේ වචනයයි. දේව වචනය කියවන්න. එය අධ්‍යයනය කරන්න. දෙවියන්වහන්සේගේ වචනයට කීකරු වන්න. එය විශ්වාස කරන්න.

**එස්. මෙත්තානන්ද**
**සංස්කාරක**
**077 8813197**

**නායකත්වයට සුදුසුකම් ලබන්නේ සේවක හදවතක් දරන අය පමණි.**

# දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම



අප අපේ ජීවිත දෙස ආපසු හැරීබලන කල, අප ස්වාමීන් වහන්සේට සැබෑ ලෙස ස්තුති දිය යුතුය. සෑම පුද්ගලයෙක්ම මේ ජීවිත ගමනේ සැප, දුක, ආශිර්වාද, වැටීම්, නැගිටීම්, අසනීප, නින්දා, අපහාස මේ සෑම දෙයක් තුලින්ම ගමන් කරයි. කිසිම කෙනෙකුට කියන්න අපහසුයි මේ එකක් තුලින්වත් මම ගියේ නැත කියා. මගේ ජීවිතේ සැමදාම ඒකාකාරීව ගලාගෙන ගියා කියා කිසිවෙකුට කිව නොහැක. ඇදහිලි වන්තයින් වන අප එක දෙයක් දැනගත යුතුය. එනම් අපි මේ සෑම අත්දැකීමක් තුලින්ම යන විට අප සමඟ සිටි ස්වාමීන් වහන්සේට සෑම කල්හිම ස්තුතියත් මහිමයත් දිය යුතුය.

## (විලාප ගී 3:21 - 25)

**"මේක මතක් කරන්නෙමි. එබැවින් මට බලාපොරොත්තුව ඇත්තේය. අප විනාශනූනේ ස්වාමීන්වහන්සේගේ කරුණාවල් නිසාත් උන්වහන්සේගේ අනුකම්පාවල් නොනවතින නිසාත් ය. ඒවා උදයෙන් උදය අළුත්ව තිබේ. ඔබගේ විශ්වාස වන්තකම මහත්ය. මාගේ කොටස නම් ස්වාමීන්වහන්සේයයි මාගේ ආත්මය කියයි. එබැවින් උන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වන්නෙමි. ස්වාමීන්වහන්සේ ගැන බලාසිටින්නන්ටත්, උන්වහන්සේ සොයන ආත්මයටත් උන්වහන්සේ යහපත් ය."**

විලාප ගී පොතෙහි කතෘවරයා යෙරමියා ය. මෙම පොත හඳුන්වන්නේ යෙරුසලමේ මරණය හැටියටයි. යුදෙව්වන්ගේ මහත්වූ පාපය, අකීකරුකම කරණකොටගෙන ස්වාමීන්වහන්සේගේ උදහසට හා දඬුවමට යෙරුසලමට මුහුණ දීමට සිදු විය. පවුරු කඩා දැමීම, දේව මාලිගයේ විනාශය, මනුෂ්‍යයින්ව වහල් කමට බබිලෝනියට ගෙනයාම යන මනුෂ්‍යයින්ගේ මහත් අකීකරු කම, දඩබ්බරකම නිසා සිදුවුනු විපත ගැන යෙරමියා මහත් සේ වැලපුන නමුත් මේ සියල්ල මැද යෙරමියාගේ හදවතේ යහපත් බලාපොරොත්තුවක් තිබුනේය.

## විලාප ගී 3:21

**මේක මතක් කරගන්නෙමි එබැවින් මට බලාපොරොත්තුවක් ඇත්තේ ය.**

**ගීතාවලිය 30 : 5**
**"මක්නිසාද උන්වහන්සේගේ උදහස ඇසිල්ලකට පමණක් ය. උන්වහන්සේගේ කරුණාව දිවිහිමි කොටය. රාත්‍රිය හැඬීම පවතින නමුත් උදය ප්‍රීතිය පැමිණෙන්නේ ය."**

**ගීතාවලිය 103:8**
**"ස්වාමීන්වහන්සේ අනුකම්පාවෙන් හා දයාවෙන් පිරී සිටින සේක. කෝපවීමට ප්‍රමාදය අතිශයින් කරුණාවන්තය."**

ස්වාමීන්වහන්සේගේ උදහස සදහටම පවතින්නේ නැති බව යෙරමියා තේරුම් ගත්තේය. ඉතින් අපටත් යෙරමියාට හා යුදෙව්වන්ට තිබුණාසේ බලාපොරොත්තුවක් තිබේ. අප මේ ලෝකයේ මනුෂ්‍යයින් මෙන් නොව, අප ස්වාමීන්වහන්සේට අයිති දරුවන්ය. දුකේ දීත් හා විපතේ දීත් අපට සැනසිල්ලක් තිබේ. මන්ද ස්වාමීන්වහන්සේ අප උදෙසා ක්‍රියා කරන සේක (නෙහෙ. 9:17).

## අපේ ගැලවීම

**විලාප ගී 3:22**
**"අප විනාශනූනේ ස්වාමීන්වහන්සේ ගේ කරුණාවල් නිසාත් උන්වහන්සේ ගේ අනුකම්පාව නොනවතින නිසාත්ය, ඒවා උදයෙන් උදය අළුත්ව තිබේ. ඔබගේ විශ්වාසකම මහත් ය."**

**යෙසායා 4:22**
**යෙසායා 53 : 3 -5**
මෙම බයිබල් පදද කියවා බලන්න.

ස්වාමීන්වහන්සේගේ මහත් වූ අනුකම්පාවත් කරුණාවත් කරණකොටගෙන උන්වහන්සේගේ ජීවිතය කුරුසියේ පූජාකර අපව සදාකාල විනාශයෙන් ගලවා ගත් සේක.

## ස්වාමීන්වහන්සේගේ විශ්වාසවන්තකම

ස්වාමීන්වහන්සේ විශ්වාසවන්ත වූ තැනැන් වහන්සේය. (2 තිමෝති 2:13) අප අවිශ්වාස වුනත් උන්වහන්සේ විශ්වාසවන්තව සිටින සේක. මන්ද උන්වහන්සේගේ වචනය උන්වහන්සේට බොරු කරන්නට බැරිය. උන්වහන්සේට අමතක වන්නේවත්, බැරිවන්නේවත් වෙනස් වන්නේවත් අපව කලකිරීමට පත් කරන්නේ වත් නැත. උන්වහන්සේ ඊයෙත් අදත් හෙටත් එකාකාරය. (මලාකි 3:6)

1 කොරින්ති 1:9, ගීතාවලිය 36:5
1 තෙසලෝනික 5:24

## ස්වාමීන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වන්නේ අප උන්වහන්සේට විශ්වාසවන්තව සිටීමයි.

අප දෙවියන්වහන්සේට විශ්වාසවන්තව සිටිය යුතුය. අපගේ ජීවිතවල අපි කොපමණ උන්වහන්සේ ට අවිශ්වාස වන්ත වී ඇද්ද? අපේ හැසිරීමෙන්, කථාවෙන්, සිතුවිලි වලින්, නමුත් උන්වහන්සේ අනුකම්පාවෙන් පූර්ණ තැනැන්වහන්සේය. දාවිත් බොහෝ පාපයට වැටුනාවූ මනුෂ්‍යයෙක් ය. නමුත් ඔහු ස්වාමීන් වහන්සේ ට විශ්වාසවන්තව සිටියේය (ක්‍රියා 13:22). අපගේ විශ්වාස වන්තකම කරණකොට ගෙන ස්වාමීන් වහන්සේගේ ආශිර්වාදය අප පිට පැමිණෙනවා ඇත.

ගීතාවලිය 31:23
ගීතාවලිය 101 : 6-7 පද කියවන්න.

## අප උන්වහන්සේගේ වචනයට විශ්වාස වන්තව සිටිය යුතුය.

උන්වහන්සේගේ වචනය බලවත්ය. එමෙන්ම උන්වහන්සේගේ වචන සදාකාලික ය.
යෙසායා 40:8
ගීතාවලිය 119:89

### උන්වහන්සේගේ වචනයෙන් පමණක් මේ මුළු විශ්වය මවනු ලැබූ සේක.

උන්වහන්සේගේ වචන ඇසීමෙන් පමණක් අප ගැලවීම ලැබුවේ ය.

### සභාවට විශ්වාසවන්තව සිටිය යුතුය.

මෙම දෙය අපෙන් ඉටුවිය යුතු වැදගත් කොටසයි.

1 යොහන් 3:23
1 යොහන් 4:12
1 පේත්‍රුස් 1:22

අප තරාතිරම නොබලා සභාවේ සහෝදර සහෝදරියන් ට ප්‍රේම කළ යුතුය. (උගත්, නුගත්, පොහොසත්) අපි කාලවල් වලට පමණක් සීමාවුන (සෘතු) යහළුවන්, තබා නොගත යුතුය. සභාවේ සහෝදර සහෝදරියන් කියන්නේ අප සභාවේ ජීවත් වී සිටින තුරු අප සමඟ සිටින අයයි. අපි එකිනෙකාට ප්‍රේම කළ යුතුය. ද්වේශ නොකළ යුතුය. අපි ඇස් වලින් නොදුටු ස්වාමීන්වහන්සේට ප්‍රේම කරන්නේ කෙලෙස ද, නිතර දකින සහෝදරයාට සහෝදරිය ප්‍රේම කරන්නේ නැතුව. ඒ වගේම අපි එකිනෙකාට ගෞරව කළ යුතුය.

### ස්වාමීන්වහන්සේ මගේ කොටසය.

ගීතාවලිය 16: 5-7
ගීතාවලිය 73:26
ගීතාවලිය 119 : 57

මේ ලෝකයේ සෑම දෙයක් ම නිශ්ඵලයි. ස්වාමීන්වහන්සේගේ උරුමය පමණයි අපට ඉතුරුවන්නේ.

- ★ අපේ තාරුණ්‍යය පහව යනවා.
- ★ අපේ ශක්තිය හීන වී යනවා
- ★ අපේ ශෝභන කම පහවයනවා.
- ★ අපේ සෞඛ්‍ය දුර්වල වී යනවා
- ★ මුදල් නැතිවී යනවා
- ★ අපේ දරුවන් අපව දාලා යනවා

ඔබේ බලාපොරොත්තුවල මුදල්, කීර්තිය, බලය, ගෞරවය නම් මේ සැම දෙයක්ම තාවකාලිකයි. මේවා අපේ ජීවිතවලට යම් ප්‍රමාණයකට අවශයයි. නමුත් සීමා මායිම් නැතිව ගියොත් භයානක වේ. අවසානයේදී හැම දෙයක්ම පහවයයි. ස්වාමීන්වහන්සේගේ උරුමය පමණක් අපට ඉතුරු වෙයි! 1 කොරින්ති 1:9 අනුව ස්වකීය පුත්‍ර වූ අපගේ ස්වාමී වූ යේසුස්වහන්සේගේ සහභාගිකමට නුඹලා කැඳවා ගත් දෙවියන්වහන්සේ විශ්වාසය සිටින සේක.

ඔබට අවශ්‍ය ශක්තිය ලැබීමට දෙවියන්වහන්සේගේ විශ්වාසනීයත්වය තුළින් පෝෂණය ලබන්න.

**- චාන්දනී ගුණවර්ධන -**

**ක්‍රිස්තියානි දිවීම යනු එකිනෙකා පැරදවීමේ ක්‍රිඩාවක් නොව ඉවසීම පිළිබඳ තරඟයකි.**

# ගස් අතර ගසක්

අපි හැමෝම අහලා තියෙනවා තාල වර්ගයට අයිති ගස් ගැන. පොල්, තල්, කිතුල්, ඉඳි ආදී ගස් තමා තාල වර්ගයට අයත් වන්නේ. කිතුණු ජීවිතය ගැන මේ ගස්වල විශේෂ ස්වභාවයෙන් අපට ඉගෙන ගන්න බොහෝ දේවල් තියෙනවා. එකක් නම් අතු විහිදී නොගොස් උසට වැඩීමයි. ඒ වගේම කෙලින්ම ශක්තිමත්ව පිහිටීමයි. යේසුස්වහන්සේ අදහන අයත්



ඒ වගෙ ස්ථිරව සිටිය යුතුය. කරදර-හිරුහැර ආවත් කණගාටු නොවී යේසුස් වහන්සේට භාරකර උන්වහන්සේව විශ්වාස කිරීමයි. මේ ගස්වල ගෙඩි හටගන්නේ උඩ මුදුනේමයි. ගෙඩි වලින් අදහස් කරන්නේ යේසුස්වහන්සේ අදහන අයගේ ජීවිතයේ තිබෙන ප්‍රේමය, සමාදානය, කරුණාව, ප්‍රීතිය ආදී යහපත් ගතිගුණයි. දැන් මේ ගස්වල ගෙඩිවලින් මොනවද වෙන්නෙ. ඒව පොළවෙ ඉන්න අයට ප්‍රයෝජනවත් වෙනවා. ඒ වගේ අපිත් අපගේ ජීවිතය ආත්මයාණන්ගේ ඵල වලින් පුරවාගෙන දෙවියන්වහන්සේටත් මනුෂ්‍යයාටත් ප්‍රයෝජනවත් අය විය යුතුය.

තාල වර්ගයට අයත් මේ ගස්වල අතු සහ ගෙඩි ආදිය තියෙන්නේ ඉහළින් ය. එයින් අදහස් වන්නේ කුමක් ද? අපි දෙවියන් වහන්සේට ළඟින් සිටිය යුතුය. පොළොවට ඉහළින් ගෙඩි තිබෙනවා වගේ අපත් පොළොවේ තිබෙන පාප දේවලට සම්බන්ධ නොවී දෙවියන් වහන්සේට ලංව ජීවත් විය යුතුය. මේ ගස්වල තවත් විශේෂ ලක්ෂණයක් නම්, එහි ජීවනය තිබෙන්නේ ඇතුලාන්තයේ වීමයි. වෙන ගස්වල තිබෙන්නේ පිට පොත්තේ ය. අප තුළද යේසුස් වහන්සේ සිටින නිසා අප ඇතුළතින් සදාකාල ජීවනය තිබේ. අපිත් ක්‍රිස්තුස්වහන්සේ කේන්ද්‍රකොට ගෙන ජීවත්වන්න හිතට ගනිමු.

"ධර්මිෂ්ඨයා තාල වෘක්ෂය මෙන් සශ්‍රීක වන්නේය." (ගීතාවලිය 92 : 12)

**- පහන්සිළුව -**

**දෙවියන්වහන්සේ ඉදිරියෙහි නිහඬව සිටින අයට උන්වහන්සේ කතාකරන සේක.**

# ජය ගනිමු.

දරුවෙකු සුරතලයට ඇති කරපු වඳුරෙක් හිටියා. ඌ හුඟක් හීලෑ සතෙක්. අර දරුවගේ කරේ වාඩිවෙලා එයාගෙ ඔලුව පීරන්නත් වඳුරා දක්ෂයි. දරුවත් ඌට ආදරෙයි. කැවුම්, පේර, ජම්බු වගේ දේවල් එයා වඳුරට ගෙන විත් දුන්නා. දවසක් මේ දෙන්නා කඩපොළට ගියා. අර මල්ලියගෙ කරේ ඉඳන් වට පිට බල බලා යන වඳුරා දැකපු හන්දියෙ ළමයි බොහෝම සතුටු වුණා. ඉදුණු කෙසෙල් ගෙඩි දෙකක් අරන් වඳුරා අතට දීපු දරුවා මෙහෙම කිව්වා. "පුංචි වඳුරු පැටියෝ ! අද මං උඹට බඩ පිරෙන්න කෑම කන්න දුන්නනේ. මේ කෙසෙල් ගෙඩි දෙක ගත්තෙ දවාලට කන්න දෙන්නයි. හොඳද.. ඒ නිසා මං කඩේට ගිහින් සීනි අරන් එනකම් මේ කෙසෙල් දෙක කන්නෙ නැතිව තියාගෙන අර ගහ උඩින් ඉන්න... මෙහෙම කියපුවම වඳුරත් හිස වනල ඒ කීමට එකඟ වුණා...



දරුවා කඩේට ගිය අතරෙ වඳුර ගහ උඩට වෙලා ඉදුණ කෙසෙල් ගෙඩි දෙක දිහා බැලුව. ඌ මෙහෙම හිතුවා. "කන්න එපා කීවට ඉඹල බලන්න එපා කීවයැ" කියල ඌ කෙසෙල් ගෙඩි දෙක ඉඹල බැලුවා. හරිම පුස්ඹයි. කටට කෙළත් ඉනුවා. ආයෙත් වඳුරා මෙහෙම කියා ගත්තා. කන්න එපා කිව්ව මිසක් ලෙලි ගහන්න එපා කීවේ නැහැනෙ." වඳුරා ඊළඟට කළේ එක කෙසෙල් ගෙඩියක් ලෙලි ගැසීමයි. සුවඳ නාස්පුඩු තුළට තදින් දැණුනාම ඌ ආයිත් මෙහෙම කියා ගත්තා. "කන්න එපා කීවට හපල බලන්න එපා කීවයැ." ඌ කෙසෙල් ගෙඩිය හපල බැලුව. ඊළඟට කළේ මොකක්ද කියල ඔයාලා දන්නවද? " කන්න හොඳ නැති වුණාට ගිලින්න හොඳා."කියල. එක පාරටම දෑස් වහල කෙසෙල් ගෙඩිය ගිල දැම්මා. පළමු වන කෙසෙල් ගෙඩිය ගිළින්න එච්චරම කරදර වුණත් දෙවැනි කෙසෙල් ගෙඩිය නම් ලෙලි පිටින්ම බඩට ගියේ හරිම ඉක්මණින්. අර දරුවා කඩේ ගිහින් එනකොට වඳුරා ලැජ්ජාවෙන් බිම බලා ගත්තා.

සහෝදර - සහෝදරයිනි, මේ කතා පිංච අපට හරි වැදගත් සත්‍යයක් උගන්වයි. අපට පරීක්ෂාවක් එනකොට අපි ඒකට එකපාරට වැටෙන්නෙ නැහැ. ටික ටික ඒකට ඉඩ දෙනවා. පරීක්ෂාවට තියන ආශාව නිසා පස්සෙ තමයි අපට තේරෙන්නෙ අපි පරීක්ෂාවට වැටිලා ඉවර බව. අපිත් පරීක්ෂාවට ටික ටික ඉඩ නොදී පරීක්ෂාවෙන් ඈතට දුවමු.

පරීක්ෂාවන් හඳුනාගෙන එය එක් වරම ප්‍රතික්ෂේප කරමු. ස්වාමීවූ යේසුස්වහන්සේගේ ආදර්ශය ලෙස පරීක්ෂාවන් ජයගෙන ශුද්ධ ජීවිතයක් ගතකිරීමට අධිෂ්ඨාන කර ගනිමු.

- ගුරු හරු -

**කිතුණුවාගේ ජීවිතය යනු අන්අයට යේසුස්වහන්සේ පෙන්වන සිතුවමකි. පොළොවේ ධනවතුන් වන්නේ ස්වර්ගයෙහි ධනය රැස්කරන අයය.**

# තවම යාච්ඤාවට පිළිතුරු ලැබුනේ නැද්ද?

**ලුක් 18 පරිච්ඡේදයේ**
**1 පදයේ සිට 8 පදය දක්වා**
**කිහිපවිටක් හොඳින් සෙමින් කියවන්න.**



මෙහිදී යේසුස්වහන්සේ අපට පවසන්නේ අසාධාරණ අධර්මිෂ්ඨ විනිශ්චයකාරයෙකුගෙන් යුක්තිය අයැද සිටි වැන්දඹුවක් පිළිබඳ උපමා කථාවකි. මෙම විනිශ්චයකාරයා දෙවියන් වහන්සේට භය නැත. මනුෂ්‍යයන්ට ද ගරු නොකරයි. සමහර විට මේ වැන්දඹුවගේ ප්‍රශ්න විසඳීමට අල්ලසක් බලාපොරොත්තු වන්න ඇත. එහෙත් ඇය දුප්පත්ය. ඇය කාලයක් තිස්සේ විනිශ්චයාකාර වෙත ගොස් තම අවශ්‍යතාවය ඉටුකර දෙන මෙන් බොහෝ ඇවටිලි කර තිබේ. එහෙත් එය ඉටු නොවීය. නමුත් ඇයට තිබුණු එකම ක්‍රමය නොකඩවා යුක්තිය ඉල්ලා සිටීමය. නමුත් ඇය නොකඩවා ඇයැද සිටීමේ ප්‍රතිඵලයක් ලෙස යුක්තිය ඉටු විය.

යේසුස්වහන්සේ මෙම උපමාව පැවසුවේ අප ද වැන්දඹුගේ ආදර්ශය ලෙස අධෛර්යමත් නොවී අත් නොහැර නොකඩවා යාච්ඤා වේ යෙදී සිටිය යුතු බව ඒත්තු ගැන්වීමටය.

**ක්ෂණයකින් පිළිතුරු නොලැබුණාත්, අප නොකඩවා යාච්ඤාවේ යෙදී සිටීම දැකීම දෙවියන්වහන්සේගේ ආශාවයි.**

මෙහිදී දෙවියන්වහන්සේ අධර්මිෂ්ඨ අසාධාරණ විනිශ්චය කාරයාට සංසන්ධනය කල සේක. උන්වහන්සේ දයානුකම්පාවෙන් හා සාධාරණත්වයෙන් පූර්ණ දෙවියන් වහන්සේ ය. නමුත් දුප්පත් වැන්දඹුවට අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා යුක්තිය ඉෂ්ඨ කලේ නම් අපගේ දෙවියන්වහන්සේ උන්වහන්සේ තෝරාගත් ජනතාවට කොපමණ වැඩියෙන් යුක්තිය ඉෂ්ට කරනවා ඇත්ද? අප සැක සිතිය යුතු නැත. උන්වහන්සේට රෑ දාවල් මොරගසන අයට උන්වහන්සේ යුක්තිය ඉටු කරන සේක.

මෙම උපමා කථාවෙන් කරුණු දෙකක් ප්‍රධාන වශයෙන් අපට ඉගෙන ගත හැක.

1. **දෙවියන්වහන්සේ ඇතැම් විට යාච්ඤාවට පිළිතුරු පමා කරන බවය.** අසාධාරණ විනිශ්චයාකාර මෙන් උන්වහන්සේ ද පිළිතුරු පවා කරන

අතර ක්ෂණයකින් පිළිතුරු නොදෙන සේක. අපගේ පීඩාව කරනකොට ගෙන අපගේ ඇදහිල්ල පරීක්ෂා කරන පිණිස යම් අසාධාරණයක් සහ පීඩාවත් (සිත්) විඳීමට හා අත්දැකීමට දෙවියන්වහන්සේ ඉඩ දෙන සේක. "පීඩා විඳීමෙන් ඉවසිල්ලද ඉවසිල්ලෙන් සහතිකකමද සහතිකකමෙන් බලාපොරොත්තු වීමද උපදින බව දැන අප විඳින පීඩාවලින් ප්‍රීතිමත් වෙමු"
(රෝම 5 3:4)

ක්‍රිස්තුස්වහන්සේගේ දුක්විඳීමත් මළවුන්ගේ නැගිටීමේ තේජසටත් අප පංගුකාරයන් කර ගන්නා සේක. අප යම් පීඩාවක් හෝ අසාධාරණයක් විඳීමට දෙවියන්වහන්සේ ඉඩ දෙන්නේ අපගේම යහපත පිණිසය. එයින් උපදින යහපත අපගේ ජීවිතයට මහත් සේ උපකාරී වේ. රෝම 8:28 වන පදයට අනුව සියලු දේ යහපත පිණිස අනාගතයේ දී එකට ක්‍රියාකරන බව අප විශ්වාස කළ යුතුය.

2. අප අත්නොහැර, නොකඩවා, උනන්දුවෙන් ක්ෂණයකින් පිළිතුරු නොලැබුණත්, අප නොකඩවා යාච්ඤාවේ යෙදී සිටීම දැකීම දෙවියන්වහන්සේගේ ආශාවයි. එසේ වන්නේ ඇයි? එයින් අපගේ ඇදහිල්ල ප්‍රකාශ වන බැවිනි. මෙහිදී අපගේ ඇදහිලි පරීක්ෂාවට ලක්වේ. අවසානයේ නියත ජය ලැබෙන බව දැන, සැක නොකොට නිරන්තරයෙන් අප දෙවියන් වහන්සේට හඬ ගැසිය යුතුය. යාච්ඤාව සියල්ල වෙනස් කරයි.

- එස්. මෙත්තානන්ද -

## ඔබත් රැස්වීමකට සහභාගිවන්න !

- ★ ඔබ ස්වාමී වූ යේසුස්වහන්සේ අදහාගත් කෙනෙකු නම් ඉරිදා උදේ 9.30 ට පැවැත්වෙන රොටි කැඩීමේ නමස්කාර මෙහෙයට පැමිණෙන්න.
- ★ ස්වාමීවූ යේසුස්වහන්සේ ලබාදෙන පාපයෙන් ගැලවීමත් සදාකාල ජීවනයත් ලබා ගැනීමට සතුටු නම් ඉරිදා සවස 4.00 ට පැවැත්වෙන ශුභාරංචි මෙහෙයට පැමිණෙන්න.
- ★ අසනීප උදෙසා, ජීවිතයේ ප්‍රශ්න උදෙසා යාච්ඤාව අවශ්‍ය නම් බදාදා හවස 6.00 ට පැමිණෙන්න.
- ★ ඔබට දේව වචනය පිළිබඳ යම් ගැටළුවක් වේ නම්, බයිබලය ඉගෙනීමට අවශ්‍ය නම් ආත්මික උපදෙස් අවශ්‍ය නම් සිකුරාදා සවස 6.00 ට පැමිණෙන්න.

# ආගම හා ගැළවීම

ආගම නිසා මිනිසා නොකරන දෙයක් නැත. එහෙත් දිව් පිදුවත් එයින් ප්‍රයෝජනයක් නැත්තේමය. ආගම මළ සිරුරක් වැනිය. එය ජීවමාන නම් පව්කාර ලෝකය ගළවා ගැනීමට පුළුවන් වනවා ඇත. පොත් පත් වලට පමණකි ආගම සීමා වී ඇත්තේ. යහපත් වැඩ කිරීමෙන් ලොව හොඳ තැනක් ලැබේ යයි සිතන අය බොහෝ ය. එසේම ලොකුවට යහපත් වැඩ ප්‍රසිද්ධියේ කරමින් තම පිළිකුල් පාප මැකී යනු ඇතැයි සිතන්නෝ ද නැත්තෙ නොවේ. තව කෙනෙකු කියන කුමන හෝ වදන් වැලක් කියවන ගිරවෙකු මෙන් ආගමික පොත් පත් වල ලියා ඇති මුද්‍රිත යාච්ඤාවල් කටපාඩම් කරගෙන කියවාගෙන යන අය මේ ආගම් පසුපස යන්නන් අතර බහුලය. ආගමික ඇඳුම් කට්ටල පැළඳීමෙන් හෝ ආගමික තනතුරු දැරීමෙන් ඔබේ අභ්‍යන්තර දුර්ගන්ධය පහව යන්නේ නැත. එය අලංකාර ලෙස මල් උයනක් සේ සකස් කළ සොහොනක් වැනිය. පිටතින් විවිධ මල් විහිදී ගියත් ඇතුළත එකම දුර්ගන්ධය ජරාව සහිත ස්ථානයකි. ඔබේ පිටස්තර ක්‍රියාවලින් ඇතුළාන්තය වැසෙනවා පමණයි. දෙවියන්වහන්සේ ගෙන් එය සඟවා ගත නොහැකි බව අමතක නොකරන්න.

**ආගම යනු මිනිසා විසින් සත්‍යයයි සිතාගෙන ලුහු බැඳී යන මිරිගුවක් පමණි.**

ආගම තුලින් විමුක්තිය සෙවීම විශාල කළුවර කාමරයක කළු බළලෙකු සොයනවා වැනි වැඩකි. සමහර තරුණ තරුණියන් ආගම එපා කරමින් කාල් මාක්ස්, ලෙනින්, මා ඕ සේතුං, වැනි අයගේ දර්ශන පසුපස ගියත් එක්තරා අන්දමකින් එයද වෙනත් ස්වරූපයකින් පැමිණෙන ආගමක් යයි කිව හැකිය. මෙම ලිපිය කියවන ඔබ සමහර විට, පුදුමයට පත්ව සිතාවි, "එසේ නම් මේ ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානයේ අය ක්‍රිස්තියානි ආගම අදහන්නෝ නොවේද කියා" පිළිතුර "නැත" යන්නයි. මෙය පැහැදිලිව අවබෝධකර ගැනීමට තව දුරටත් ලිපිය කියවා ගෙන යන විට හැකිවෙනවා ඇත.

ක්‍රිස්තියානි ආගම යනු ලියවිල්ලෙහි එන ව්‍යවස්ථාව අනුගමනය කිරීමට මිනිසා විසින් ගනු ලබන උත්සාහයක් පමණි. එම උත්සාහයන්හි නිෂ්ඵල බව කිතුණු නිකායයන්හි ඇති තත්වයෙන්ම පැහැදිළි වේ. ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය අනුග්‍රහයෙන් ලොකාලෝකය සඟරාව මඟින් ඔබ වෙත ඉදිරිපත් කරන්නේ හිස් ආගමක් නොව, මිනිසාට පාපයෙන් ජය දී නව ජීවිතයක් උදාකරදීමට බලවත් ජීවමාන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වයි. එතුමාණෝ කරණ කොට ගෙන පාපයෙන් හා නිරයෙන් ගැළවීම තිබේ. රෝම 3:24 අනුව එය දෙවියන්වහන්සේගෙන් නොමිළයේම ලැබෙන දීමනාවකි.

ආගම යන වචනය අපගේ කණට හොඳින් හුරු පුරුදුය. ඔබේ ආගම කුමක්ද යන්න බහුලව ඇසෙන ප්‍රශ්නයකි.

යම් ධර්මානුකූල ප්‍රතිපත්ති හෝ ව්‍යවස්ථා මාලාවක් හැම ආගමකින්ම ඉගැන්වේ. මාක්ස්ගේ ධර්මයෙහි ඇදහීමේ කර්තෘවරයෙක් නැත. බෞද්ධාගමේ ද ධර්මය දේවත්වයෙහි ලා සළකනු ලැබේ. එසේ නම් කොමියුනිස්ට් වාදයද ආගමක් යයි සැලකීමට පුළුවන් කමක් ඇත. හේතුව මාක්ස්ගේ න්‍යායධර්මය ගුරුකොට හැසිරෙන නිසාය. සමාජවාදී, (කොමියුනිස්ට්) ධර්මයේ හැර අනෙකුත් බොහෝ ආගම් වල මිනිසාට යහපත් මාර්ගයේ යෑමට උපදෙස් හෝ ව්‍යවස්ථා මාලාවක් ගෙන හැර දක්වයි. ආගම් අදහන බොහෝ දෙනා දර්ශනවාදය හා විවිධ ඉගැන්වීම් වල පැටලී සිටිති. ඉගැන්වීම් ගැඹුරු වූ පමණින් එය නුවණට හුරු වූ පමණින් එහි සත්‍යය නොරැඳේ.

දහස් ගණනින් ආගම් තිබුණත් ලෝකයේ සාමය, ප්‍රේමය දිනෙන් දිනම පහත මට්ටමට බැසයයි. යුද්ධ ඝෝෂා දසතින් ඇසේ. රාජ්‍යයන්හි අභ්‍යන්තර ගැටුම්, කැරළි ආරවුල් ත්‍රස්තවාදය කෙළවරක් නැත. මේ කුඩා ලංකාව ඇතුලේම පැවති ත්‍රස්තවාදී අරගල, ජාති භේද ඔබට අමතක නොවනු ඇත. ආගම් වලට කුමක් වීද? සිතාවි ආගම ධර්මයේ වරද නොව මිනිසා එය නොපිළිපැදීමේ ප්‍රතිඵලය යයි කියා. ඇයි මිනිසා ආගමානුකූල ප්‍රතිපත්ති, ව්‍යවස්ථා නොපවත්වන්නේ. එයට එකම පිළිතුර මිනිසා ස්වභාවිකවම දුර්වල යන්නයි. තම හිසට තම අත යයි ඉගැන්නුවත් අත් දෙකම නැති මිනිසෙකුට එම ඉගැන්වීමෙන් කිසිම ප්‍රයෝජනයක් නැත. තව කෙනෙකුගේ අත් දෙකක උපකාරයක් අත් නැති අසරණයාට කෙතරම් පිටුවහලක් ද? ආගම යනු අත් නැති අසරණයෙකුට මෙන්න මෙය රැගෙන අනුභව කරන්නැයි කියා තව කෙනෙකු විසින් පිළිගන්වන ප්‍රණීත රසැති කෑම පිඟානක් වැනිය. එම ආහාර බඳුන ඉතාම හොඳයි. එය අල්ලා ගැනීමට වත් ඔහුට අත් නැත. ආගමත් හොඳයි. නමුත් පිළිපැදීමට තරම් මිනිසාට බලයක් නැත. ආගම යනු මිනිසා විසින් සත්‍යයයි සිතාගෙන ලුහුබැඳ යන මිරිගුවක් පමණි. විශාල වියදම් රැසක් දරාගෙන වන්දනා ගමන් ගියද පෙරළා පැමිණි පසු ඔවුන්ගේ ජීවිතය වෙනස් වී නැත. තවමත් දුම් වැටිය ඇඟිලි තුඩු වල රැඳී ඇත. මත් පැන් වීදුරුව පෙරසේම පිරී පවතී. රහස් පාප පළමු තත්ත්වයේම ඇත. කට පුරා හොඳ හැටි බුලත් විට පිරී තිබේ. ගෙදර අඩදබර වෙනසක් නැත. රේස් කොළය හැම උදෑසනකම අමතක නොවේ. එසේ ගිය ගමනින් කිසිදු ප්‍රයෝජනයක් වී නැත. එකම ප්‍රයෝජනය පෞද්ගලික බස්රථ හිමියාට හොඳ ආදායමක් ලැබීමත්, වන්දනා ස්ථානවල අරමුදල් තර වීමත් පමණි. මෙන්න ආගම් ඇදහීමේ ප්‍රතිඵල. හොඳින් සිතන්න.

මිනිසාගේ ගැළවීමේ සැලැස්ම සූදානම්කරන ලද්දේ ස්වර්ගයේදීය. එය මෙලොවට පැමිණියේ දෙවිපියාණන් වහන්සේ මනුකයක් ගෙන යේසුස් යන නාමයෙන් මෙලොව බිහිවීමෙන් ය. මෙම ගැළවීමේ මාර්ගයේ ජයග්‍රහණය සිදුවූයේ කල්වරි කන්ද මත කුරුසිය නමැති පූජාසනයේදී. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලොවෙහි සෑම දෙනාගේම විමුක්තිය උදෙසා තමන්ම පූජාවූ සේක. එහෙත් දින තුනක් ඇතුළත ශුද්ධ ලියවිලි අනාවැකි පරිදිම මරණය පරදවා නැගිට වදාළ සේක. ඔව් ! ආගමකට එහා ගිය ගැලවීම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මිනිසාට ප්‍රධානය කරන සේක. එය පිලිගැනීමට ආගමික මිනිසා සූදානම් ද? අඩුතරමේ ඔබ සූදානම් ද?

***- හොරණෑ හඬ -***

# ඔබ සොයන්නේ කුමක් ද?



මං ඔබට කතා කරන්නේ අන්ද්‍රෑ නම් යේසුස්වහන්සේගේ ගෝලයා තුළින් ඉගෙන ගත හැකි පාඩමක් ගැනයි. ඔහු තරුණ වයසේ දීම යොහන් බව්තීස්ත ගෙන් යෝර්දාන් ගඟේ බව්තීස්ම ලබා ඔහුගේ ගෝලයකු බවට පත්විය. දිනක් යොහන් යේසුස්වහන්සේව දැක අන්ද්‍රෑ හා තව ගෝලයකුට උන්වහන්සේ "ලෝකයේ පව් දුරු කරන තැනැන් වහන්සේ බව" පෙන්වා දුන්නේය. අන්ද්‍රෑ වැඩිදුර යම් සත්‍යයක් ඉගෙනීමට උනන්දුවූ අයෙක්. ඔහු යේසුස්වහන්සේ පසුපස ගමන් කළ අතර උන්වහන්සේ හැරී ඔහු හා අනෙක් තැනැත්තා දැක, "නුඹලා සොයන්නේ කුමක් දැයි?" ඇසූ විට ඔව්හුත් ප්‍රශ්නයකින් පිළිතුරු දුන්නාහ. "ඔබ නැවතී සිටින්නේ කොහේද? ප්‍රශ්නය එයයි. යේසුස් වහන්සේ, "ඇවිත් බලන්නැයි" (යොහ. 1:39) උත්තර දුන් සේක. අන්ද්‍රෑ හා මිත්‍රයා උන්වහන්සේ සිටින තැනට ගොස් යොහන්ට වඩා යේසුස්වහන්සේ උතුම් හා බලවත් වග දැනගත් හැටියේ තමාගේ සොහොයුරු සීමොන්ටත් මේ යහපත් ආරංචිය රැගෙන දිව ගියේය. සීමොන් සහ යේසුස්වහන්සේගේ ගෝලයෙකු බවට පත්වූ අන්ද්‍රෑත් මරණය දක්වාම ගෝලකම රැක ගත්තේය.

අන්ද්‍රෑත් තරුණව සිටියදී, වඩා හොඳදේ, ගැඹුරු සත්‍ය සොයන පිණිස පියවර ගත් අතර, ඔහු දැන සිටි ටික නිසාම හිස උදුම්මාගත්තේවත්, සත්‍යය සෙවීම නතර කළේවත් නැත. අපේම සමාජයේ උගත් බොහෝ අය සිතනවා "මං දන්නවා හොඳටම ඇති මගේ ආගම මට හොඳයි මහළු අයට හොඳයි ආගම. මමත් මහළු උනාම ආගමට බැඳෙනවා. පින්දහම් කරනවා." කියල හිතන තරුණ සිත් අප අතර ඕනේ තරම් සිටියි.

නරකද ටිකක් හිතල බැලුවොත්, තමන් දන්නා දෙයට වඩා තව ඉගෙන ගන්ට දේවල් හුඟාක් වැඩියි කියලා. යේසුස්වහන්සේව මටත් හමුවූයේ අවුරුදු 20 දියි. අන්ද්‍රෑට වගේ, තරුණ අයටත් බාල අයට හා මහලු අයත් යේසුස් වහන්සේව ඕනෙමයි. කරදරවලින්, පාපබරින්, ලෙඩදුකින් මිදීමට නම් එකම මඟ ආගමක් නොව යේසුස්වහන්සේයි. අපගේ ඇතුලාන්ත හිස්කම පිරවිය හැකි එකම තැනැත්තා යේසුස්වහන්සේය. ඔබට මොනවා තිබුණත් යේසුස්වහන්සේ නැතිනම් ඔබගේ ජීවිතය නිෂ්ඵලය.

**- මිකායෙල් -**

**ඇදහිල්ලට හැරීම මොහොතකින් සිදු වේ. දක්ෂයකු බවට පත්වීමට ටික කාලයක් ගතවේ. එහෙත් මුහුකුරා යාමට ජීවිත කාලයක් ගතවේ.**

# - දොරකඩ නම් මමය -

ප්‍රිය මිතුර මිතුරිය, ඔබ සෑම දෙනෙකුම පාහේ දවසකට කිහිප වරක්ම දොරකඩවල් නොහොත් දොරටු තුළින් ඇතුල් වනවා නොවේ ද? යම් ගෘහයක් කාර්යාලයක්, ආයතනයක් හෝ ශාලාවක් වේවා ඕනෑම ගොඩනැගිල්ලකට අප ඇතුල්වන්නේ දොකඩක් තුළින්ම නොවේ ද? සමහර විටදී දොරකඩින් ඇතුල් නොවී වහලෙන් හෝ ජනේලයකින් ඇතුල් වන්නන් ගැනද ඉඳහිට අසන්නට ලැබෙන බව නම් සැබෑයි. එහෙත් එසේ ඇතුල් වන්නේ සොරුන් බව අපි දනිමු.

අපගේ එදිනෙදා ලෞකික ජීවිතයේ සැබෑවන දේ ආත්මික ජීවිතය සම්බන්ධව, ඉතා සත්‍යයව තිබේ. සෑම ගොඩනැගිල්ලකට ඇතුල් වීමේ දී දොරකඩකින් ඇතුල් විය යුතුවා සේම, දෙවියන්වහනසේගේ රාජ්‍යයට ඇතුල් වන්නාද දොරකඩකින් ඇතුල් විය යුතු බව ශු. බයිබලය පවසයි. එහෙත් මේ දොරකඩ ගැන තිබෙන අපූර්ව දෙය නම් දොරකඩ ලී වලින් සැදූ එකක් නොව පුද්ගලයකු වීමයි.

**"දොරකඩ නම් මමය. යමෙක් මා කරණකොට ගෙන ඇතුල්වේ ද, ඔහු ආරක්ෂා කරනු ලැබ ඇතුලට සහ පිටතට ගොස් ගොදුරු ලබන්නේ ය.**
(යොහන් 10:9)

## අපූර්ව දොරටුව

"දොරකඩ නම් මම වෙමි" යි පැවසූ මිහිපිට වාසය කළ එකම මිනිසා ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යයි කීම වැරදි නැත. ශු. බයිබලයේ යොහාන් 10:9හි උන්වහන්සේගේම වචනයට අනුව දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල් වීමට හැකි එකම දොරකඩ තමන් බව උන්වහන්සේ පැවසූ සේක. ඔබ මේ අපූර්ව දොරකඩින් ඇතුල් වී තිබෙනවා ද? "මාර්ගයද ජීවනයද සැබෑවද මම වෙමි. මා කරණකොට ගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත." (යොහාන් 14:6) "අපේ ගැලවීමට අවශ්‍ය වූ මනුෂ්‍යයන් අතරේ දෙන ලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත්තේ ය." (ක්‍රියා 4:12)

මේ වචන කියවන්නා වූ ප්‍රිය මිතුර, ඔබ කොහේ ද? ඔබ දෙවියන් වහන්සේගේ රාජ්‍ය තුළ සිටින කෙනෙක් ද? එසේ නම් ඔබ මේ උන්වහන්සේගේ ආත්මික රාජ්‍යයට ඇතුල්වුනේ කොහොම ද? වෙනත් වචනවලින් පවසනවානම් ඔබ ක්‍රිස්තියානි ඇදහිලිවන්තයෙකු වුනේ කොහොමද? ඔබට සිහිකර ගන්න පුළුවන් ද ඔබ ඒ අපූර්ව දොරකඩ වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල් වූ දවස ගැන ? එසේ නැතිව ඔබ උපතින්ම ක්‍රිස්තියානි පවුලක සිටි නිසා හෝ එහෙම නැතිනම් ඔබට ක්‍රිස්තියානි නමක් තිබෙන නිසා, එහෙමත් නැතිනම් දෙවියන් වහන්සේ ගැන භක්තියක් ඔබට තිබෙන නිසා හෝ ඔබ නිතරම අවංකව ජීවත්



වන්නට උත්සාහ කරන නිසා ඔබ දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුලත් වී සිටිනවා යැයි ඔබ සිතනවා ද? මෙන්ම යේසුස්වහන්සේ පවසන වචන "දොරකඩ නම් මමය. යමෙක් මා කරණකොට ගෙන ඇතුල්වේ ද, ඔහු ආරක්ෂා කරනු ලැබ ඇතුලට සහ පිටතට ගොස් ගොදුරු ලබන්නේ ය. (යොහන් 10:9) වෙන කිසි දොරටුවක් නැත. සදාකාල ජීවනයට ඇති එකම මඟ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් වැටී ඇත.

## ඇතුල් වන්න

උන්වහන්සේ වෙතට ඔබ පුද්ගලකවම තනිවම පැමිණිය යුතුය. තවකෙකුට ඔබ සමඟ ඇතුල්වීමට ඉඩ නැත. එකිනෙකා තනි තනිව පැමිණිය යුතුය. සදාකාලික ජීවනය ද, ස්වර්ගයේ දොරටුව ද, සමාදානයේ කුමාරයා ද යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. යේසුස් වහන්සේගේ සමාදානයෙන් ඔබගේ සිත පිරී යනවා ඇත. යේසුස්වහන්සේගේ ජීවනයේ ඔබ අළුත් වෙනවා ඇත. උන්වහන්සේ තුළින් ඇතුල්වන්නා පමණක් සදාකාලිකවම ආරක්ෂා කරනු ලැබේ.

"දොරකඩ නම් යේසුස් වහන්සේය. ජීවනයද නැවත නැඟිටීමද යේසුස්වහන්සේය, මාර්ගයද, ජීවනයද, සැබෑවද, යේසුස්වහන්සේය. ජීවන දායක කෑම නම් යේසුස්වහන්සේ ය. පටන් ගැන්වද අවසානයද යේසුස්වහන්සේ ය.

## ප්‍රිය මිතුර,

**තෝරා ගැනීම් ඔබ සතුය. දෙවියන්වහන්සේගේ ආත්මය ඔබගේ සිත සමඟ විවාද කරන සේක. යේසුස්වහන්සේව පිලිගන්න. අදහාගන්න. උන්වහන්සේට යටත් වෙන්න කියා උන්වහන්සේ පවසන සේක. සිටින තැනම දණගසා ඔබගේ සිත උන්වහන්සේට යටත් කරන්න. එවිට ඔබ ඒ අපූර්ව සුදර්ශී දොරටුව වන යේසුස්වහන්සේ තුළින් ස්වර්ග රාජ්‍යයට පිවිසුම වේ. සදාකාල ජීවනය වන උන්වහන්සේම ඔබ තුළට ඇතුල්ව සිටින සේක.**

**-පසුගිය කලාපයකින් උපුටා ගන්නා ලදී.-**

**කිතුණුවාගේ ජීවිතය යනු අන් අයට යේසුස්වහන්සේ පෙන්වන සිතුවමකි.**

# යේසුස්වහන්සේගේ යාච්ඤාව

"මා සන්තක සියල්ල ඔබගේ ය. ඔබ සන්තක සියල්ල මාගේය." (යොහන් 17:9) එලෙස යේසුස්වහන්සේ යාච්ඤා කරනසේක්. ප්‍රියාදර හිතවත ඔබ සන්තක සියල්ල කාගේ ද? සමහරවිට ඔබට සිතේවි, ඔබේ දරුවන්ට අයිතිවේය කියා. නැත. ඔබ යේසුස්වහන්සේ තුළ නව ජීවිතයකට පාතැබූ කෙනෙක් නම් තවත් ඔබට කිසි අයිතිවාසිකමක් නැත. ඔබ සන්තක සියල්ල (බිරිඳ - දරුවන්, මව් පිය සහෝදර සහෝදරියන්) ස්වාමීන් වහන්සේට අයිතිය, තවමත් යම් කිසිවක් ඔබේම අයිතියෙහි තබා ගෙන සිටිනවා ද?

යේසුස් වහන්සේ ඔබේ ජීවිතය පව්න්, නිරයෙන්, සාතන්ගේ බලයෙන් ගළවා, සදාකාලික ස්වර්ගීය සැපත අත් කර දීම සඳහා තමන්ගේ නිර්මල ජීවිතය පූජා කළ සේක. අපි එතුමන්ට කුමක් පුදම් ද? අපේ පිරිසිදු සිතත්, අපේ සියළු අයිතිවාසිකම් ද, අපේ කැමැත්ත ද උන්වහන්සේට කැපකරමු. මේ තත්ත්වය පැහැදිලි කර ගැනීමට අපි පුංචි උදාහරණයක් ගනිමු. ඇදහිලිවන්ත පියෙකු සිටින එකම පුතා ඉතා උසස්ම අධ්‍යාපනය ලබා ඉහළින්ම සමත් වී උසස් තනතුරක් දැරීමට සූදානම්ව සිටිනවා යයි සිතන්න. එහෙත් ස්වාමීන් වහන්සේ එම පුත්‍රයාව දේව සේවයට කැඳවා ගැනීමට සතුටු වී එම පුතාටත්, සිතට කතාකළා යයි ද සිතන්න. දැන් අර පියා ගන්නා තීරණය කුමක් ද? මෙය බලාපොරොත්තු නොවූ තත්ත්වයක්, පහත් අඩියක සිටින පියෙකු වියහැකියි. තමා සන්තක සියල්ල එම පියා ස්වාමීන් වහන්සේගේ අයිතියට පවරා සිටියා නම් ඔහු මහත් ආශාවෙන් ඒ උතුම් සේවයට තම එකම පුත්‍රය ඇතුළු වෙනවට විරුද්ධව ක්‍රියා නොකරයි. මෙය පහසු දෙයක් නොවේ යයි පෙනුනත්, ස්වාමීන් වහන්සේව එය අපට පහසු කර දෙන සේක.

මෙලෙස අප තමා සහ තමා සතු සියල්ල ස්වාමීන්වහන්සේගේ අයිති වාසිකම මත තැබූ කල්හි උන්වහන්සේ සතු සියල්ලද අපගේ අයිතියට ගලා එනවා ඇත. පර්වත දෙදරණ යාච්ඤාවකට උවමනා බලයද ඒ ආශීර්වාද ගංගාව අතරේ ඔබ වෙත ළඟා වෙනවා ඇත. මේ කරුණු ඉතාම හොඳින් සිතෙහි ධාරණය කරගන්න. ස්වාමීන්වහන්සේව ඔබේ මුළු සිතම අයිති ද? එසේ නොවේ නම් එහි පුංචිකාමරයක් හෝ තවම ඔබට අයිතිව තිබේදැයි විමසා බලන්න. ආත්මික සත්‍යය තේරුම් ගැනීමට යේසුස් වහන්සේගේ අනුග්‍රහය ඔබට උපකාර කරන සේක්වා.

**- මිකායෙල් -**

**ක්‍රිස්තුස්වහන්සේට සමාන වීමට අපට ඇති එක් ආකාරයක් වන්නේ අන් අයගේ වේදනාවට අප දක්වන සංවේදී බවයි.**

ළමා පිටුව

# උපන් දින සාදය



අද මම පුංචි පුතාලට දුවලට කියා දෙන්න යන්නේ බොරු කියන්න පුරුදු වෙලා හිටිය පුංචි ළමයෙකු ගැන කථාවක්. නිමල් කියල එක දඟකාර ළමයෙක් හිටියා. මේ ළමයා විනෝදයට කරන්නේ කුමක් හෝ බොරුවක් කියල එයාගෙ යාළුවන්වයි, ගෙදර අනිත් අයවයි රවටන එකයි, අම්මයි තාත්තයි කෙතරම් උත්සාහ කළත් නිමල්ගෙ බොරුකීම නම් අත්හැර ගන්න බැරුව ගියා.

නිමල්ගෙ උපන් දිනයත් ළඟා වුණා. එයා පංතියෙ යහළුවන්ට තමාගෙ උපන් දින සාදයට ආරාධනා කළා. ඔන්න උපන් දින දවසත් උදාවුණා. නිමල්ගෙ අම්ම රසවත් කෑම මේසයක් එහෙම සූදානම් කරල තිබුණා. නිමල් දැන් එයාගෙ යාළුවො එනකම් නොඉවසිල්ලෙන් බලා සිටියා. වී අයත් සමඟ කාල බීල විනෝද වෙන්න. සෙල්ලම් කරන්න පැය ගණන් ගෙවිලා ගියා. යාළුවො නම් එන පාටක් නෑ. හවස් වෙනකම්ම පාර බලන් හිටියත් කවුරුවත්ම ආවේ නෑ. ඔහුට ගොඩක් දුක හිතුණා. ඇස්වලට කඳුළු පිරුණා. ප්‍රීති විය යුතු දිනයක් කනගාටු වෙන් ගෙවී ගියා.

බොරු කියන එක පාපයක්. ලොකු බොරුවක් වුණත් පොඩි බොරුවක් වුණත් පාපය එකමයි. විහිළුවටවත් බොරු කීම වැරදියි. මේ පුතාල දුවල දන්නවද බොරු පියා කව්ද කියල? ඔහු තමා යක්ෂයා.

පසුවදා නිමල් පාසැල් ගියේ ලැජ්ජාවෙන්. එයා යහළුවන්ව මුණ ගැහිල ඇසුවා තමන්ගේ උපන් දිනයදා නොපැමිණියේ ඇයි කියා? එවිට යහළුවො කීවා, ඇයි අපි හිතුවේ ඔයා අපට කීවේ බොරුවක් කියලා. ඇයි ඔයා කියන තරමක් බොරුමනේ කියන්නෙ." නිමල්ට කාරණය වැටහුණා. "මම අදින් පස්සෙ ආයි කවදාවත්ම බොරු කියන්නෙ නෑ." නිමල් යහළුවන්ට කීව.

බොරු කියන එක පාපයක්. ලොකු බොරුවක් වුණත් පොඩි බොරුවක් වුණත් පාපය එකමයි. විහිළුවටවත් බොරු කීම වැරදියි. මේ පුතාල දුවල දන්නවද බොරුවේ පියා කව්ද කියල? ඔහු තමා යක්ෂයා. එහෙම නම් බොරු කියන අයගෙත් පියා වන්නේ යක්ෂයාමයි. යක්ෂයාගෙ ළමයි වෙන්නට පුංචි ඔබ කැමති නැහැ නේද? ඒ නිසා යේසුස් වහන්සේගෙන් සමාව ලබාගෙන බොරු කීමෙන් වලකින්නට හිතට ගන්න. ශුද්ධ වූ බයිබලයේ ලියා තිබෙනවා බොරු කියන්නන්ට නිරයෙහි තමන්ගේ කොටස උරුම බව.

සෑම විටම බොරු නොකියා, වංචාවකින් තොරව, දේව වචනයට කීකරුව ජීවත්වෙන්න හිතට ගන්න.

**- තබීතා නැන්දා -**

# ලෝකය හදමු ද ? මම හැදෙනව ද?



එක්තරා ගුරුවරයෙක් සිය ශිෂ්‍යයින්ට පාඩම් කියාදෙන අතර සමාජ සාරධර්ම ගැන ද කියා දීමට පුරුදුව සිටියේ ය. දිනක් ඔහු කොළ කැබලි කීපයක් අතට ගෙන, ශිෂ්‍යයින් අමතා "මේ තියෙන්නේ ලෝකයේ සිතියමක ඉරුණු කොළ කැබලි කීපයක්. දැන් මේ ළමයින්ට පුළුවන්ද මේවා එකට තියලා කලින් තිබුණා වගෙ ලෝක සිතියම සාදන්න." යයි ප්‍රකාශ කළේය. ළමෝ ඊට අසමත් වූහ. එවිට සිය ශිෂ්‍යයින් ඇමතූ ගුරුවරයා, "ඔව් ඒක කරන්න මටත් අමාරුයි. නමුත් එක විදියක් තියෙනවා. ඔය සිතියමේ අනිත් පැත්තේ තිබුණා මිනිසෙකුගේ රූපයක්. අන්න ඒ මිනිසා පළමුව සෑදුවොත්, ලෝකයත් ඉබේම හැදේවි" කියා. එක ළමයෙක් ඒ මිනිසා හදා සම්බන්ධ කළා. අනිත් පැත්තෙ ලෝක සිතියමත් අඩුවක් නැතිව සම්පූර්ණ වී තිබුණා. මේ අත්දැකීම උපමාවට ගෙන පළමුව මිනිසා හොඳ කෙනෙක්ව හැදුනොත් ලෝකයත් ඉබේම හොඳ සම්පූර්ණ ලෝකයක් වෙනවා යයි ගුරුවරයා පෙන්වා දුන්නේ ය.

ලෝකය හදන්නට පෙර එක් එක් මනුෂ්‍යයා යහපත් ගුණධර්ම වලින් සෑදී සිටිය යුතු බව එම කතාවෙන් අදහස් වෙයි. එය කරන්නේ කෙසේ ද? ලෝක ස්වභාවය නම් මේ කාර්යය ලෝක ආගමික බලධාරීන් වෙත පැවරීමයි. මේ දක්වා ම සෑම ආගමක්ම එම කාර්‍යයෙහි නියැලී සිටියි. ඉන් ප්‍රතිඵලයක් ලැබී තිබේ ද? නැත.

ලෝකයේ විවිධ ආගම් මගින් යහපත් ගුණ ධර්ම දේශනා කෙරුණත් දිනෙන් දිනම ලෝකය ගුණ ධර්ම වලින් පිරිහී යයි. අද ශ්‍රී ලංකාවේ සිදුවන විවිධාකාර අපරාධ ඊට නිදසුන් සපයයි. එසේනම් තවත් අළුත් ආගමක් ඉදිරිපත් කිරීමෙන් අත්වෙන සෙතක් නැත. අපි ඔබ වෙත ආගමක් දේශනා කරනවා නොවේ පළමුව මිනිසා තුළ හරි වෙනස් වීමක් ඇතිකළ යුතු වේ. මේ වෙනස්කිරීම ඇති කරන්නට හැකි සමතෙක් සිටීනම් ඒ තැනැත්තා ලෝකයේ ගැලවුම්කරු වන බව අපි දනිමු.

ප්‍රීතියට කරුණක් ! ඔව් ඒ ගැලවුම් කාරයාණන් මට හමුවිය. එතුමා මගේ ජීවිතය මුළු මනින්ම වෙනස්

**යේසුස්වහන්සේ අදත් ස්වර්ගයෙහි ජීවමානව ශරීරයෙන් යුක්තව රජකම් කරන සේක.**
**නුදුරු අනාගතයේ දී උන්වහන්සේ එතුමන් අදහා ගත් සෙනඟ ස්වර්ගයට ගෙන යෑමට මැද අහසට පැමිණෙන සේක.**

කළේය. මා සිත අළුත් විය. සිත සාමයෙන් පිරුණි. පාපකාරී ස්වභාවය මා හැර ගියේය. ජීවිතයේ සැහැල්ලු බවක් හැඟුනි. මගේ ජීවිතය මෙන්ම ඔබේ ජීවිතයද මාරු කරන්නට, අළුත් කරන්නට, එතුමන්ට හැකියාව ඇත.

මගේ ජීවිතය අළුත් වූවා පමණක් නොවේ. අයුක්තිය, අසාධාරණත්වය, බියනැති, සදාකාලික දේශයක පුරවැසි කමද මට නොමිළයේම අත්වුණි. මේ සියලු සත්‍ය තොරතුරු එළිදරව් වන්නේ ශුද්ධ වූ බයිබලය නම් මහා පුදුම ශ්‍රේෂ්ඨ පුරාණ ග්‍රන්ථයෙහිය. මේ බලසම්පන්න පොත තුළින් එළිදරව් කරන්නා වූ ඒ ජීවමාන ගැලවුම්කාරයා නම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය.

උන්වහන්සේගේ ප්‍රකාශයක් ශුද්ධ වූ බයිබලයෙහි මතෙව් ශුභාරංචියේ 11 වන පරිච්ඡේදයේ 2 වන වගන්තියෙහි මෙසේ සඳහන් වේ.

**"වෙහෙසවන්නා වූ බර උසුලන්නා වූ සියල්ලෙනි, මා වෙතට පැමිණෙන්න. මම ඔබට සහනය දෙමි."**

එතුමන් වෙත ගිය මා ලද සහනය ලබා ගැනීමට ඔබටත් අවස්ථාව තිබේ. එතුමන් හඳුනාගන්න. අදින් වසර 2000 පමණ ඉහත දී මරියා නම් මවගෙන් උන්වහන්සේ මෙලොවට බිහි වූ සේක. එම උපත සිදුවූයේ ගව හලක ඉතා දිළිඳු තත්ත්වයකය. මෙතරම් දිළිඳු



තත්ත්වය කින් බිහිවූ මේ යේසුස් ළදරුවා අහස පොළොව හා එහි ඇති සියල්ලේත්, මිනිසුන් ඇතුළු සියලු ජීවත් වන ප්‍රානීන්ගේත්, මුළු මහත් විශ්වයේත් නිර්මාතෘ වන සර්ව බලධාරී දෙවියන් වහන්සේමය. එතුමා මෙලොව බිහිවූයේ මිනිසෙකු පරිද්දෙන් මිනිසුන් අතර ගැවසී, මිනිසුන්ගේ දුකට පිහිට වෙමින්, ඔවුන්ට ශුභාරංචිය ප්‍රකාශ කර, අවසන මිනිසුන්ගේ, සියලු පොළෝ වාසීන්ගේ පව්වලට වන්දියක් ලෙස ජීවිතය පූජා කිරීමටයි. කල්වාරි කඳු ශිඛරය මත ලී කුරුසියක ඇණ ගැසුම්කා එතුමා දිවි පිදුවේ මෙම ස්වර්ගයේ සිටම සැලසුම් කරගෙන ආ මිනිසාගේ ගැළවීමේ සැලැස්ම අනුවය. සොහොනක තැන්පත් කරන මුත් ශුද්ධ බයිබලයේ ලියැවී තිබූ පුරාණ අනාවැකි අයුරින්ම එතුමා මරු පරදා තුන්වන දින නැගිටුණ සේක්, දින හතළිහක් තුළ ශ්‍රාවකයන් හා අන් අය අතර සිටිසේක්, පන්සීයකට වැඩි සෙනඟක් එතුමන් දුටු බව, සියැසින්ම උන්වහන්සේ දැක ගැනීමට හැකිවූ පාවුල් තුමා කොරින්ති වරුන්ට ලියූ ලිපියේ සඳහන් කරයි. පසුව ශ්‍රාවකයන් බලා සිටියදීම උන්වහන්සේ ස්වර්ගයට නැගී ගිය සේක.

යේසුස්වහන්සේ අදත් ස්වර්ගයෙහි ජීවමානව ශරීරයෙන් යුක්තව රජකම් කරන සේක.නුදුරු අනාගතයේ දී උන්වහන්සේ එතුමන් අදහා ගත් සෙනඟ ස්වර්ගයට ගෙන යෑමට මැද අහසට පැමිණෙන සේක. එතුමන් ප්‍රකාශ වූ කළ එතුමන් අදහාගෙන සිට මළා වූ අය ශරීර ආත්ම යලි සම්බන්ධ වී (නව සිරුරින්) නැගිටින්නාහ. ජීවත්ව සිටින ඇදහිලි වන්තයින් නැගිටුනාවූ අය සමඟ ස්වර්ගයට යන බව බයිබලය පවසයි.

ඉන් අනතුරුව පොළව මත වචනයෙන් විස්තර කළ නොහැකි තරම් ඉතා භයානක පීඩා කාලයක් ආරම්භ වේ. කවර කලෙකවත් සිදු නොවූ අන්දමේ පීඩා උපද්‍රවයනට ගොදුරුව බොහෝ දෙනා විනාශ වෙති. මේ භයානක කාලයට ඇතුළු නොවී යේසුස්වහන්සේ සමඟ ස්වර්ගයේ සදාකාලික රජ්‍යයෙන් සිටීමට යන්න ඔබ සතුටු නම් ප්‍රමාද නොවී දැන්ම උන්වහන්සේව අදහාගන්න. උන් වහන්සේ ඔබේ ජීවිතය සැලසුම් කරන සේක. ප්‍රමාද වී පසුතැවී පලක් නැත. මේ සියලුම සත්‍ය තොරතුරු ශුද්ධ වූ බයිබලය නම්, දේව වචනය අඩංගු පුස්තකයේ දිව්‍ය ආනුභාවයෙන් ලියැවී ඇත.

**"මාර්ගයද, සැබෑවද, ජීවනයද මමය මා කරණකොටගෙන මිස කිසිවෙක් පියානණ්වහන්සේ වෙත පැමිණෙන්නේ නැත."**

(යොහන් 14:6)

ඔබත් දිනපතා බයිබලය කියවන්න ආරම්භ කරන්න. යථාර්ථය හා සත්‍ය දැනගන්න.

**පහන් සිළුව**

**දුරකථන යාච්ඤා සේවය :**

**ඔබගේ අවශ්‍යතාවය අනුව දුරකථනය ඔස්සේ යාච්ඤා කරගැනීමට හැක.**

**ඒ සඳහා පහත දුරකථන අංකය අමතන්න.**

**077 8813197**

**පාන්දර 4.00 - 6.00 දක්වා පමණක් අමතන්න.**

**දෙවියන්වහන්සේගේ පිළිතුරු ඔබගේ යාච්ඤාවට වඩා බලවත්ය. ඔබගේ විශාලම බර පවා සැහැල්ලු කිරීමට යාච්ඤාවට හැකිය.**

# ලත් පමණින් සතුටු වීම සහ ඔබ

**තරුණ හදගැස්ම**

'ලත් පමණින් සතුටු වීම' යන ආත්මික අභියෝගය හමුවන්නේ 1 තිමෝති 6 : 6 පදයෙනි. පාවුල් තුමා තිමෝති නමැති තරුණ දේව සේවකයාට දුන් ගුරු හරුකම් 1 වන හා 2 වන තිමෝති යන ලිපිවල අන්තර්ගතවේ. පාවුල් තුමා මෙම ලිපි ලියුවේ රෝම නගරයේ සිටයි. සුළු ආසියාවේ (අද තුර්කිය) පළාත් සභාවක් භාරව සිටි තිමෝති හමුවීමට අවස්ථාවක් නොලත් හෙයින් මෙම ලිපිමඟින් අවශ්‍ය උපදේශ යැවිණි. ක්‍රි. ව. 65 දී පමණ මේවා ලියා ඇති බව සිතති. මෙම කාලයවන විට පාවුල්තුමා මහළුව සිට ඇත. එනිසා තරුණ තිමෝති දේව වචනයෙන් පූර්ණවත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් විණි.

"ලත් පමණින් සතුටුවීම සමඟ භක්තිවන්තකම මහත් ලාභයක් මය" (1 තිමෝති 6:6) මෙම පාඨයේ අඩංගු කරුණු කොටස් කළ හැකිය. ලත් පමණින් සතුටු වීම, ඒ සමඟම භක්තිවන්තකම ඇතිකර ගැනීම, එය ලාභයක්සේ සැළකිය යුතුවීම යනුවෙන් ඒ කොටස් දැක්විය හැක.

තරුණ සිත නොයෙක් ආශාවන්ගෙන් පිරී පවතී. විශේෂයෙන් තරුණ සිත් පොළඹවන නොයෙක් නිෂ්පාදන වලින් වෙළඳපොළ පිරී යයි. මහත් පරීක්ෂා සෝදිසි කිරීම් එවිට මතුවේ. ජීවත්වීම් පහසු කරනු ලබන විවිධ ද්‍රව්‍යාකාර දේවල් වෙළඳ පොළ ආක්‍රමණය කරයි. ජන සන්නිවේදන මාධ්‍ය මඟින් රවටනු ලබන මනුෂ්‍යයා විවිධ ද්‍රව්‍ය මිලදී ගැනීමේලා උත්සුක වේ. තමන් වෙහෙස මහන්සියෙන් උපයාගත් මුදල් විවිධ මාදිලියේ ද්‍රව්‍ය උපකරණ අත්පත් කර ගැනීමට යෙදවේ. ඇතැම්විට ණය වෙති. අතමිට සරු අය අත දිගහැර වැය කරති. තමන් රිසිදෑ ලබා ගැනීමට නොහැකිව ළතැවෙන අයද ඇත. මෙයින් ලෞකික සිතෙහි ස්වභාවය අපට පැහැදිලි වේ. ක්‍රිස්තුස් යේසුස්වහන්සේට භාර නොදුන් සිත ලෝකයටම ඇළුම් කරයි. "ලෝකය සමඟ මිත්‍රකම දෙවියන් වහන්සේට සතුරුකම බව නුඹලා දන්නේ නැද්ද?" (යාකොබ් 4:4)

"අනුකරණය" යන අදහස ද මනුෂ්‍යයාගේ ආශාවන් වර්ධනයට හේතු වේ. ලද පමණින් සතුටු වීමට උත්සාහ දරන අතර තුර තමන්ට දක්නට ලැබෙන නොයෙක් දේ ගැන තෘෂ්ණා පහලවිය හැකිය. ස්වාමී වූ යේසුස්ක්‍රිස්තුස් වහන්සේට භාර නොදුන් සිතට එවන් ආශාවලින් නිදහස්විය නොහැක. ක්‍රිස්තුස්වහන්සේට සිත භාර දී ඇතිවිට අනුකරණයෙන් බාධා නොපැමිණේ. පැමිණියත් එය ජයගත හැක. පාවුල්තුමා ශුද්ධ වූ ලියවිල්ලෙහි මෙසේ පවසයි. "මාගේ ජීවත් වීම නම් ක්‍රිස්තුස් වහන්සේ උදෙසා ය. මරණයද මට ලාභයක් ය."